# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2027/16 - 2017 ජූලි මස 11 වැනි අඟහරුවාදා - 2017.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 3/7/12/7.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : එල්ඩී/05/2007/පීසී/270.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩපළාත කෝරළේ 533 සී රත්නායකපුර ග්‍රාම නිලධාරි වසමේ ලිඩස්ඩේල් වත්තේ පිහිටි මු.පි.නු. 3087 පිඹුරේ පෙන්වා දී ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0843 ක් වන කැබලි අංකය 01න් පෙන්වා දී ඇති ඉඩම්.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: ලිඩස්ඩේල් වත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.0843.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 අගෝස්තු මස 16 වැනි දින පෙ. ව. 10.00 ට වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද 2017 අගෝස්තු මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

අයි. එම්. සේනානායක,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2017 ජූනි මස 16 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-821


1A - G 25884 - 66 (2017/07)



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශුද්ධි පත්‍රිකාවයි

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

අංක 312/15 සහ 1984 අගෝස්තු 31 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය හා බැඳේ.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

ගාල්ල දිස්ත්‍රික්කයේ වැල්ලබඩ පත්තුව (උතුර) ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාසයේ, උඩුවිල ගමේ පිහිටි මූලික පිඹුරු අංක ගා/1914හි කැබලි අංක 01 කඩේවත්ත නමැති ඉඩම.

**කැබලි අංක 01**

ඉඩමේ නම: කඩේවත්ත; විස්තරය: ගෙවත්ත, අවුරුදු 10-12 දක්වා වයසැති අඹගස් 1ක් සහ පුවක් ගස් 06ක් ද, රට උළු සෙවිලි කරන ලද කපරාරු බිත්ති සහිත ස්ථිර වැසිකිළියක් ද, පෙදරේරු කරන ලද ළිඳක් ද ඇත; ප්‍රමාණය: හෙක්. 0.06048.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්/අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2017 සැප්තැම්බර් මස 27 වැනි දින පෙ. ව. 9.00 ට අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද 2017 සැප්තැම්බර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි. ඉඩම්වල නම අයිතිය තහවුරු කිරීම සඳහා අදළ ඔප්පු සහ වෙනත් ලිපි ලේඛන පරීක්ෂණ දිනයේ දී රැගෙන ආ යුතු යි.

එච්. කේ. සරසි එස්. ගුණසේකර,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්ගොඩ.

2017 ජූනි මස 22 වැනි දින,
අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-822

ශුද්ධි පත්‍රිකාවයි

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය : 3/2/3/10/241(iv).

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියට යටත්ව අංක 1822/23 හා 2013.08.08 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමේ 3A පිටුවේ සඳහන් මු.පි.ගම් 3891 කැබලි අංක 44 මැනුම් සංශෝධනය පරිදි ඉඩම් පරිහරණය ගෙවත්ත ලෙස සංශෝධනය කර එහි ශුද්ධි පත්‍රිකාව අංක 1966/18 හා 2016.05.10 දිනැති සංශෝධිත *ගැසට් පත්‍රයේ* 1ඒ පිටුවේ පළ විය. නැවත අදළ හිමිකරුවන් විසින් ලබා දී ඇති අංක 48/2014 අධිෂ්ඨාපන පිඹුර අනුව නැවත මැනුම් කටයුතු සිදුකළ අතර එම මැනුම් සංශෝධනය පරිදි ගම් 3891 කැබලි අංක 44 කැබලි අංක 247 සහ 248 සහ 249 ලෙස විභජනය වී ඇති අතර ඒ අනුව කැබලි අංක 44 ට අදළ ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**කැබලි අංක 247**

ඉඩමේ නම: හොරගොල්ලවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: චන්ද්‍රිකා බණ්ඩාරනායක; ප්‍රමාණය: හෙක්. 0.0140.

**කැබලි අංක 248**

ඉඩමේ නම: හොරගොල්ලවත්ත; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: මියගිය අනුර බණ්ඩාරනායක; ප්‍රමාණය: හෙක්. 0.0089.

**කැබලි අංක 249**

ඉඩමේ නම: හොරගොල්ලවත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: චන්ද්‍රිකා බණ්ඩාරනායක; ප්‍රමාණය: හෙක්. 0.0124.

ඩී. එම්. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2017 මැයි මස 30 වැනි දින,
අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-823

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.